★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) ගිණුම්කරණයේ වැදගත්කම පිළිබඳ දැක්වෙන ප්‍රකාශය තෝරන්න,

01. සම්පත් පාලනය කිරීමේ උපකරණ පිළිබඳව අනාගත තොරතුරු සපයා දේ.
02. මූල්‍ය සම්පාදන හැකියාවන් පිළිබඳ තොරතුරු සපයාදේ.
03. ව්‍යාපාරය පිළබඳ ඇල්මක් දක්වන බාහිර පාර්ශවයන්ට සහ කළමණාකරනයට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සපයාදේ.
04. සම්පත් මෙහෙයවීම හා පාලනය පිළිබඳව අභ්‍යන්තර කළමණාකරුවන් දැනුවත් කිරීම.
05. ගිණුම් තැබීමේ කාර්‍යය සඳහා ගනුදෙනු සපයාදේ.

(02) කුලී වියදම් සඳහා මුදල් නොගෙවූ නමුත් ගිණුම් කාලපරිච්ඡේද අවසාන දිනට වගකීමක් ලෙස හඳුනාගෙන ඇත. මීට මඟපෙන්වන ලද ගිණුම්කරණ සංකල්පය වන්නේ,

01. මුදල පදනම
02. උපචිත
03. අඛණ්ඩ පැවැතීම
04. අයභාරය උපළබ්ධි වීම
05. කාලච්ඡේද

(03) ගාමිනි වෙළඳ සැල විසින් 2015 මාර්තු මාසය සඳහා පිළියෙළ කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය පහත දැක්වේ.

බැංකු ගිණුමේ ශේෂය		526000
ඉදිරිපත් නොවූවෙක්	60000	
ලාභාංශ එකතුකිරීම්	40000	100, 000
		626,000
නිත්‍ය නියෝග ගෙවීම්	(10000)	
නිශ්කාශානය නොවූ චෙක්	(23000)	33,000
බැංකු ප්‍රකාශනයේ ශේෂය		593,000

ශේෂ පත්‍රයේ පෙන්විය යුතු බැංකු ශේෂය කීයද?

01) 556,000
02) 526, 000
03) 593, 000
04) 566, 000
05) 536, 000

(04) පාන් පිටි නිශ්පාදන සමාගමක් 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ කෙටුම්පත් ශුද්ධ ලාභය 1,350000 ගණණය කර ඇත. නමුත් වර්ෂය අවසාන දිනට රු. 840 000 පිරිවැයවූ තොගයක් පැවතියද එම තොග හානි වීමක් නිසා එහි විකණුම් මිලෙන් 50% දක්වා අඩු කිරීමට සිදුවිය. භාණ්ඩ විකණුම් මිල ලකුණු කරන්නේ විකණුම් මිලෙන් 30% ලාභ ලැබෙන පරිදිවේ. මෙම තොග පිළිබඳ සැලකිල්ලට ගත් පසු වාර්ෂික ශුද්ධ ලාභය කීයද?

01) 510, 000
02) 1, 000 000
03) 1, 110 000
04) 1, 220 000
05) 1, 175 000

(05) 2013/03/31 දිනෙන් අවසන් වර්ෂයේ රක්ෂණ ගාස්තු වශයෙන් රු. 24 000 ගෙවන ලදී. මෙම මුදල ගෙවා ඇත්තේ පහත සඳහන් රක්ෂණ ආවරනයන් සඳහා වේ.

රක්ෂණ වර්ෂය	රක්ෂණ වාරිකය	ආවරණය වන කාලය
ගිනි	9000	2013/07/30 දිනෙන් අවසන් වන වර්ෂය
සාමාන්‍ය	12000	2012/03/31 සිට 2012/11/30
මාර්ගස්ථ මුදල්	3000	2013/03/31 දිනෙන් අවසන් වර්ෂය

ආදායම් ප්‍රකාශයට හර කළ යුතු රක්ෂණ වියදම් කීයද?

01) 24,000 02) 30,600 03) 27,000

04) 28,000 05) 21,000

(06) ඉහත තොරතුරු අනුව කලින් ගෙවූ රක්ෂණ ගාස්තු ප්‍රමාණය කොපමණද ?

01) 3000 02) 9000 03) 24,000

04) 12,000 05) 15,000

(07) රුවන් වෙළෙඳ සැල 2015/03/31 දින පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සම නොවීය එහි වෙනස තාවකාලිකව අවිනිශ්චිත ගිණුමක ලියා තබා පසුව පහත වැරදි අනාවරනය කරගන්නා ලදි.

- රු. 6000 ණයට විකුණුම් නයගැති ගිණුමට රු. 8000 ලෙස හරකර තිබීම.
- රු. 1300 දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමට බැර කර තිබීම.
- ආපසු එවුම් රු 2000 ආපසු එවුම් ගිණුමට රු. 4000 ලෙස හර කර තිබීම.
- රු. 3000ක යන්ත්‍ර අළුත්වැඩියාවෙ යන්ත්‍ර ගිණුමට හර කර තිබීම.

ඉහත වැරදි හේතුවෙන් ශේෂ පිරිකසුමේ වෙනස වූයේ,

01) බැරපත්ත රු. 1400 න් අඩුවීම. 02) හරපැත්ත රු 1400 න් අඩුවීම.

03) හරපැත්ත රු 4000න් වැඩිවීම. 04) හරපැත්ත රු 2600 න් වැඩිවීම.

05) බැරපැත්ත රු 2600න් අඩුවීම.

(08) 2014/01/01 දිනට වත්කම්, වගකීම් සහ හිමිකම් පහත පරිදි වේ.

වත්කම් - 160,000 ප්‍රාග්ධනය - 100,000 වගකීම් - 60,000

ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු පහත පරිදිවේ.

01) ණයට ගැනුම් රු. 20,000 02) වරිපනම් ගෙවීම් රු. 5000

03) රු. 50000 තොග රු. 60000 විකිනිම. 04) මුදල් ගැනිල් රු. 10000

2014/01/31 දිනෙන් අවසන් මාසයේ හිමිකම වෙනස් වීම වන්නේ,

01) රු. 5000 වැඩි වීම. 02) රු. 5000 අඩු වීම 03) රු. 10000 න් වැඩි

04) 10000 න් අඩු 05) 15000 න් අඩු

(09) ණයගැති පාලන ගිණුමේ ශේෂය 2016/03/31 දිනට රු.40,000 විය. එදිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 27,000 විය මීට හේතු විය හැක්කේ පහත සඳහන් කුමන වරදක්ද?

01) රු. 13000 ණයගැති පාලන ගිණුම අඩුවෙන් එකතුවී තිබීම.

02) රු. 13000 ණයට විකුණුම් සුරංගගේ පුද්ගලික ගිණුමට හර කර නොතිබීම.

03) රු. 13000 ක විකුණුම් ඉන්වොසියක් අස්ථානගත වීම.

04) රු. 13000ක බැරපත් වාර්තා කිරීම සම්පූර්ණයෙන් මඟ හැර තිබීම.

05) ණය ගැති පාලන ගිණුමට වැඩිපුර රු. 13000 ක බොල්නය බැර කර තිබීම.

(10) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරනු ලබන වත්කම් මිනුම් කරමේ ක්‍රමය වන්නේ,

01) වෙළඳ පළ මිලට 02) උපලබ්ධි අගයට 03) ඓතිහාසික පිරිවැයට

04) ශුද්ධ වර්තමාන අගයට 05) උපලබ්ධි විය හැකි අගයට

(11) විකිනීම හෝ ආපසු එවීමේ පදනම මත රු. 300,000ට ඉන්වොයිස් කරන ලද තොගයක් නිහාල් සහ සමාගම විසින් නුවන් සමාගමට ලබා දී ඇත. 2015/03/31 දින වන විට තොගයෙන් අවඩක් විකිනී ඇති බව නුවන් සමාගම විකුණුම් විස්තරයකින් දන්වා ඇත. තොග ඉන්වොයිස් කර ඇත්තේ පිරිවැයට 20% ලාභ ආන්තිකයක් ලැබෙන පරිදිය විකුණුම් හා ඉතිරි තොගයේ අගය

	විකුණුම්	**ඉතිරි තොග**
01)	300,000	250,000
02)	150,000	125,000
03)	300,000	150,000
04)	250,000	125,000
05)	360,000	180,000

(12) ඔරික්ස් සමාගම තොග ගනනයේදී අයිතම් ක්‍රමයට ශුද්ධ උපලබ්ධි අගය ගණනය කරනු ලබයි. පහත සඳහන් තොග විස්තර ඔබ වෙත සපයා ඇත.

තොග අයටම්	**ඒකක පිරිවැය**	**ඒකක ගණන**	**ඇස්තමේන්තු විකුණුම් මිල**	**ඇස්තමේන්තු ඒකක විකුණුම් වියදම්**
X	**15**	**10000**	**12**	**2**
Y	**8**	**5000**	**12**	**2**
Z	**20**	**5000**	**15**	**2**

LKAS (02) අනුව බඩු තොගයේ වටිනාකම කොපමණද?

01) 205,000 02) 235,000 03) 255,000

04) 290,000 05) 300,000

(13) බැංකු ගිණුමේ ශේෂය එදිනට ලබාගත් බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවීය. 2015/03/31 දිනට බැංකු ගිණුමේ බැර ශේෂය රු.5000 විය. පසුව පහත තොරතුරු අනාවරණය කර ගන්නා ලදී.

- ඉදිරිපත් නොවූ චෙක් 3000/=
- නිශ්කාශනය නොවූචෙක් 4000/=
- නිත්‍ය නියෝග මත ගෙවීම් 2000/=
- ප්‍රේෂන 6000/=

2015/03/31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ,

01) 6000 02) (2000) 03) 5000 04) (6000) 05) (5000)

(14) කීර්තිනාමය ගැලපීමෙන් කුමක් අරමුණු කරන්නේද?

01) වත්කම් නියමිත පරිදි ප්‍රකාශනයට 02) විශ්‍රාම ගැන්වීම හේතුවෙන්

03) නව භවුල් කරුවකු බඳවා ගැනීම හේතුවෙන් 04) භවුල් කරුවන්ගේ හිමිකම සාධාරණව ගණනයට

05) බුත්වත් වූ ව්‍යාපාරයේ තොරතුරු අතවරනයට

(15) නිෂ්පාදන ව්‍යාපාරයක 2015 දෙසැම්බර් මාසයට අදාළ පිරිවැය තොරතුරු පහත පරිදිවේ. රු'000

- පරිභෝජනය කරන ලද ද්‍රව්‍ය 500
- සෘජු ශ්‍රම පිරිවැය 400
- කම්හල පොදු කාර්ය 100
- නිමි තොගයේ වැඩිවීම 100
- නොනිමි තොග අඩුවීම 200 (ප්‍රාථමික පිරිවැයට)

2015 දෙසැම්බර් මාසයේ ප්‍රාථමික පිරිවැය සහ විකුණුම් පිරිවැය කීයද ?

	ප්‍රාථමික පිරිවැය	**විකුණුම් පිරිවැය**
01)	1,100 000	1,000 000
02)	1,100 000	1,200 000
03)	1,200 000	1,150 000
04)	1,250 000	1,100 .000
05)	1,300 000	1,300 000

(16) 2015/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ සහ ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව අතර සැසඳුම් ලේඛනය පහත දැක්වේ.

ණයගැති පාලන ගිණුමේ ශේෂය	10,000
විකුණුම් අධි ගණනය	300
අධිගනනය වූ බොල්නය	(100)
ශේෂ ලැයිස්තුවේ එකතුව	10,200

ඉහත වැරදි සහිතව කෙටුම්පත් ශුද්ධ ලාභය ගණනය කර ඇත. ශුද්ධ ලාභය ඇත. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 3,000 000 කි. ජංගම වත්කම් රු. 2,000 000 කි. ඉහත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු නිවැරදි ශුද්ධ ලාභය හා ජංගම වත්කම් ඇතුලත් කණ්ඩය තෝරන්න.

	ශුද්ධ ලාභය රු'000	පංගම වත්කම් රු.'000
01)	3100	2100
02)	1800	2000
03)	2800	1800
04)	2900	1800
05)	2700	1700

(17) පහත තොරතුරු සීමිත ගයාන් පොදු සමාගමට සම්බන්ධව වේ. එම තොරතුරු ඇසුරින් මෙහෙයුම් ශුද්ධ මුදල් ප්‍රවාහයේ වැඩිවීම හෝ අඩුවීම ගණනය කරන්න.

ශුද්ධ ලාභය	රු. 400,000
දේපළ පිරියන උපකරණ ක්ෂය	රු. 60,000
යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභය	රු. 120,000
වෙළඳ ණයගැති වැඩිවීම්	රු. 90,000
වෙළඳ ණයහිමි වැඩිවීම	රු. 70,000
ගෙවිය යුතු වැටුප් අඩුවීම	රු. 30,000
පෙර ගෙවුම් අඩුවීම	රු. 50,000

01) 280,000 02) 460,000 03) 412,000 04) 340,000 05) 520,000

(18) පහත සඳහන් තොරතුරු රාජා සමාගමේ 2015 මාර්තු මාසයේ වැටුප් සම්බන්ධයෙන් වේ.

මූලික වැටුප	100
අතිකාළ දීමනා	18
දීමනා	20
	138
වැටුප් අත්තිකාරම්	(18)
ආපදා ණය	(16)

අර්ථ සාධක අරමුදලට දායකය සේවක 8% (මූලික වැටුප මත)

අර්ථ සාධක අරමුදලට දායකය සේවය 12%

සේවා නියුක්තියන්ගේ භාර අරමුදල 3%

සේවක වැටුප් සම්බන්ධ මුළු වියදම කොපමණද ?

01) 152,400 02) 153,000 03)138,000 04) 141,600 05) 122,000

(19) පහත දැක්වෙන්නේ සේවක වැටුප් ගණනයේදී යොදා ගනු ලබන ලියවිලි කීපයකි.

A – දෛනික කාල පත්‍රය B – පැමිණීමේ ලේඛනය

C – කාර්ය තුන්ඩුව D – කාර්ය පත්‍රිකාව

E – කෑලි වැඩ තුන්ඩුව

වැඩකළ කාලය හඳුනා ගැනීමට නොහැකි මූලාශ්‍ර ලේඛන මොනවාද ?

01) A පමණි 02) B පමණි 03) A හා B පමණි

04) A,B,C හා D පමණි 05) A,B,C,D හා E සියල්ලම

(20) පහත සඳහන් කුමන ගිණුම් අනුපාතයක් ප්‍රාග්ධනය හා ශුද්ධ ලාභය අතර සම්බන්ධතාව පෙන්නුම් කරනු ලබයිද?

01) වත්කම් ප්‍රතිලාභ අනුපාතය 02) හිමිකම් ප්‍රතිලාභ අනුපාතය 03) දළ ලාභ අනුපාතය

04) ශුද්ධ ලාභ අනුපාතය 05) යෙදවුම් ප්‍රතිලාභ අනුපාතය

(21) මුළු ස්ථාවර පිරිවැය පෙන්නුම් කරනු ලබන වක්‍රය තෝරන්න.

01)



02)



03)

04)



(22) සීමිත නිමිකෝ සමාගම X භාණ්ඩය නිපදවා ආලෙවි කරයි.

- ස්ථාවර පිරිවැය රු. 300,000
- ඒකක පිරිවැය රු. 500
- විචලය පිරිවැය රු. 300

රු. 500,000 ලාභය ලැබීමට කොපමණ ඒකක ප්‍රමාණයක් අලෙවි කළ යුතුද ?

01) 2000 02) 4000 03) 1500 04) 3000 05)2500

(23) ලාල් සහ සමාගම Y නම් වූ නිශ්පාදිතයක් නිපදවයි. ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

- ඒකක දායකය රු. 10
- විචල්‍ය ඒකක පිරිවැය රු. 25
- ස්ථාවර පිරිවැය රු. 300,000

සම්විච්ඡේද ලක්ෂ විකුණුම් වටිනාකම කීයද?

01) 100,0000 02) 1100,000 03) 1150,000 04) 550,000 05) 1050,000

(24) විදුලි ඇනහිටීමකින් ඇති වූ යන්ත්‍ර හානිවීමක් හේතුවෙන් සේවක වැඩ අකර්මන්‍ය වීම වාර්තා කරනු ලබන්නේ,

01) කාර්ය තුණ්ඩුව 02) දෛනික කාල පත්‍රිකාව 03) අකර්මන්‍ය කාල පත්‍රිකාව

04) කාර්ය පත්‍රිකාව 05) යන්ත්‍ර හානි තොරතුරු වාර්තාව

(25) ගැමුණු පොදු සමාගමට ආශ්‍රිතව 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ පහත තොරතුරු සපයා ඇත.

- ලාභ පරිමාව අනුපාතය 60%
- වාර්ෂික විචල්‍ය පිරිවැය 400,000/=
- වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 800,000/=

2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය හෝ අලාභය කීයද?

01) රු. 600,000 ලාභ
02) රු. 600,000 අලාභ
03) රු.200,000 පාඩු
04) රු. 400,000 ලාභ
05) රු. 200,000 ලාභ

(26) ලංකා විදුලි සමාගම ආශ්‍රිත විදුලි වියදම් සම්බන්ධ හැසිරීම පහත පරිදිවේ.

- ඒකක 1000 දක්වා ඒකකයකට රු.10
- ඒකක 1000 ට වැඩි ඒකකයකට රු.15 බැගින් වේ.

පහත සඳහන් කුමන වක්‍රය මගින් විදුලි වියදම් හැසිරීම පෙන්නුම් කරනු ලබයිද?

01)


02)


03)


04)


05)

01) A
02) B
03) C
04) D
05) E

(27) නිවැරැදි ප්‍රකාශය තෝරන්න.

01) පොදු කාරිය පිරිවැය නිශ්පාදන පිරිවැය තුල අන්තර්ගත කරනු නොලබයි.
02) සියළුම විචල්‍ය පිරිවැය සෘජු නිශ්පාදක පිරිවැය වේ.
03) වක්‍ර ශ්‍රම පිරිවැය සියල්ලම නිශ්පාදන පිරිවැයේ කොටසකි.
04) සියළුම පොදුකාර්ය පිරිවැය ආදායම් ප්‍රකාශනයට ලියා හරි.
05) සියළුම සෘජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ.

(28) ව්‍යාපාරයක ද්‍රවශීලතාව මිනුම් කිරීම සඳහා කුමන අනුපාත සැලකිල්ලට ගනු ලබයිද?

A – ජංගම වගකීම් / මුළු ණය
B – මුළු වගකීම්/ හිමිකම්
C – දිගුකාලීන ණය/ මුළු වත්කම්
D – ජංගම වගකීම්/ මුළු වත්කම්

01) A හා D පමණි
02) A,B, හා C පමණි
03) A,C හා D පමණි
04) B, හා C පමණි
05) B,C හා D පමණි

The National e-learning Portal for The General Education

(29) P අයිතමය සම්බන්ධයෙන් පහත පරිදි තොරතුරු සපයා ඇත.

- කාර්තුවක පරිභෝජනය ඒකක 1250
- රඳවාගැනිමේ පිරිවැය රු. 25
- ඇනවුම් කිරමේ පිරිවැය ගැනුම් මිලෙන් 10%
- ගනුම් මිල ඒකකයක් රු.250

ආර්ථික ඇනවුම ප්‍රමානය ගණනය කරන්න.

01) ඒකක 50 02) ඒකක 100 03) ඒකක 1000 04) ඒකක 2500 05) ඒකක 5000

(30) නිහාල් සහ සමාගමේ ජංගම අනුපාතය 4:1 කි. කුමන ගනුදෙනුව මෙම අනුපාතය අඩුකිරීමට බලපෑම් ඇති කරයිද?

01) දිගුකාලීන ණය ලබා ගැනීම
02) ලාභයක් සහිතව බඩුතොගයක් ණයට විකිනීම
03) යන්ත්‍රයක් අත්පිට මුදලට ලබා ගැනීම
04) ණය ගැති මුදල් ලැබීමක්
05) ණයහිමියන්ට මුදල් ගෙවීමක්

(31) පහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීමට යොදාගන්නා මූලික පොත් සහ ඊට අදාළ කර ගන්නා මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

		මූලික පොත	මූලාශ්‍ර ලේඛනය
01)	අයිතිකරු ව්‍යාපාරයට යෙදු රු. 100,000		
02)	ණයට ගැනුම් ආපසු යැවුම් 5000		
03)	ණයට ලබාගත් ලිපිද්‍රව්‍ය 3000		
04)	අඩමාණ ණය සඳහා වෙන්කිරීම්		

(32) 2015 ජනවාරි 01 දිනට සිරිල් වෙළඳ සැලේ රු.15000 බැංකු ගිණුමේ ශේෂයක් තිබු අතර බැංකු ප්‍රකාශනයේ එදිනට ශේෂය රු. 20000 විය. මීට හේතුව වුයේ ගෙවීමට ඉදිරිපත් නොවු චෙක් පත් රු.5000 තිබීමයි.

මාසය අවසාන දිනට බැංකු ගිණුමේ සංශෝදිත ශේෂය රු. 12000 වු අතර බැංකු ප්‍රකාශනයේ ශේෂය 25000 විය. මාසය තුල නිශ්කාශනය නොවු චෙක්පත් කිසිවක් නොවීය. ඉහත වෙනසට හේතුවිය හැකි කරුණක් වටිනාකම සමඟ සඳහන් කරන්න.

.....

.....

(33) ලාභලාභ සමව බෙදාගත් A,B, හා C හවුලෙන් 2015/03/31 දින C විශ්‍රාම ගන්නා ලදි. ප්‍රාග්ධන ගිණුම මගින් කීර්තිනාමය ගලපන ලදී. A හා B 5:4 අනුපාතයට ලාභ බෙදා ගනිමින් හවුළ ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යන ලදි. A හා B ප්‍රාග්ධන ගිණුම් පහත පරිදිවේ.

	A	B
කීර්තිනාමය ගැලපීමට පෙර	300,000	160,000
කීර්තිනාමය ගැලපීමට පසු	260,000	140,000

විශ්‍රාම ගන්නා දින එකඟවු කීර්තිනාමය කොපමණද?

.....

(34) පහත දැක්වෙනනේ 2015/03/31 දිනෙන් අවසන් වන වර්ෂයේ සී/ස දසුන් පොදු සමාගමේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයයි.

ගනුදෙනු අංකය	සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	පොදු සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපයුම්
ශේෂයන්	3000	1000	500	400
A	2000			
B				2000
C		1000		(1000)
D	600		(400)	(200)

වර්ෂය තුල සිදුව ඇති එක් එක් ගනුදෙනුව විස්තර කරන්න.

A –.....

B -.....

C -.....

D -.....

(35) සීමිත ලංකා පොදු සමාගමට අදාළ තොරතුරු කීපයක් පහත දී ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය	රු.000
සාමාන්‍ය කොටස්	5000
වරනීය කොටස්	1000
පොදු සංචිත	3000
10% ණයකර	800
විකුණුම්	4000
විකුණුම් පිරිවැය	2200

- බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය හිමිකමෙන් 10% ට සමාන වේ.
- මුළු වත්කම් වල වටිනාකම හිමිකම මෙන් දෙගුණයකි.

පහත දෑ ගණනය කරන්න.

01) පොලි ආවරණ අනුපාතය .....

02) වත්කම් විකුණුම් අනුපාතය .....

(36) ගඩොල් නිපදවන සමාගමක ද්‍රව්‍ය පරිභෝජනය පිළිබඳ තොරතුරු කීපයක් පහත දී ඇත.

දිනය	විස්තරය	ලැබීම්			නිකුත්			ශේෂය	
		ඒකක	මිල	වටිනාකම	ඒකක	මිල	වටිනාකම	ඒකක	වටිනාකම
1/4/14	ශේෂය							500	5000
3/4/14	ලැබීම්	1000	12	12000				1500	17000
10/4/14	නිකුත්				500	10	5000		
					500	12	6000	500	6000
					1000		11000		
13/4/14	ලැබීම්	1000	15	15000				1500	21000

ඉහත වගුව අධ්‍යයනය කර යලි ඇනවුම් ප්‍රමාණය සහ යලි ඇනවුම් මට්ටම් දක්වන්න.

.....

.....

(37) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම හා ප්‍රාග්ධන ගිණුම් අතර පවතින වෙනස්කම් 2 සඳහන් කරන්න.

	ප්‍රාග්ධන ගිණුම	ජංගම ගිණුම
01.		
02.		

(38) සමාගමක තොග පාලන පිරිවැය සම්බන්ද තොරතුරු පහත පරිදි ප්‍රස්ථාරයක් මගින් ඉදිරිපත් කර ඇත.



ඉහත අක්ෂර වලින් දැක්වෙන වක්‍ර නම් කරන්න.

A - .....

B - .....

C - .....

D - .....

(39) ගබඩාවක තොග මට්ටම් තීරයක කිරීමේදි සැලකිල්ලට ගනු ලබන සාධක 02 ක් සඳහන් කරන්න.

01) .....

02) .....

(40) සීමිත පුබුදු සමාගම 2015/03/31 දිනට හා 2014/03/31 දිනට වත්කම් හා වගකීම් පහත පරිදි ඉදිරිපත් කරයි. රු.000

	2014/03/31	2015/03/31
ණයගැතියන්	500	600
ණයහිමියෝ	400	300
බඩුතොග	200	100

අමතර තොරතුරු - වර්ෂයට තුල සිදුවු ගනුදෙනු

විකුණුම්	රු. 900,000
ගැනුම්	රු. 400,000
පොලි ගෙවීම්	රු. 50,000
බදු ගෙවීම්	රු. 80,000
මෙහෙයුම් වියදම්	රු. 30,000

විකුණුම් පිරිවැය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කරන්න.

01) .....

02) .....

(41) ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථාවන් 2 සඳහන් කරන්න.

01) .....

02) .....

(42) වාහන අළුත්වැඩියා අංශයක් පවත්වාගෙන යන දසුන් ගේ ව්‍යාපාරයේ ශ්‍රම පිරිවැය හිණුම්ගත කිරීමට අදාළ ලියවිලි නම් කරන්න.

01) සෘජු ශ්‍රම පිරිවැය .....

02) වක්‍ර ශ්‍රම පිරිවැය .....

(43) පහත සඳහන් වගුව ලී බඩු නිෂ්පාදන ආයතනයකට සම්බන්ද පිරිවැය තොරතුරු ඇතුළත් කර ඇත.එම පිරිවැය වගුවේ දැක්වෙන ආකරයට වර්ග කර දක්වන්න.

පිරිවැය අයිතමය	විචල්‍ය	ස්ථාවර	සෘජු	වක්‍ර
01) ගොඩනැගිලි බදු ගෙවීම්				
02) ලී මිලදී ගැනීම				
03) විකුණුම් සහකරුගේ කොමිස්				
04) ඒකක පදනම මත ගෙවූ වැටුප්				

(44) සමාන ව්‍යාපාර දෙකක ගිණුම් ශේෂයන් කිපයක් පහත දැක්වේ.

	X	Y
විකුණුම්	4000	2400
මුලු හිමිකම්	500	1000
මුලු වගකීම්	300	200

- කුමන ආයතන ඉහළ වත්කම් පිරිවැටුම් අනුපායක් නිරූපණය කරන්නේද?

.....

(45) මුළු විස්තීර්ණ ආදායම විස්තර කරන්න.

.....

(46) කෙටිකාලීන ද්‍රවශීලතාවය මිනුම් කළ හැකි අනුපාත 02 ක් නම් කරන්න.

01) ..... 02) .....

(47) අනුෂන් සමාගම පහත සඳහන් තොග පිළිබඳ විසතර සපයයි.

1/5 මිළට ගැනුම් ඒකක 500 එකක් රු.50 බැගින්

1/6 මිළට ගැනුම් ඒකක 800 එකක් රු. 60 බැගින්

1/8 මිළට ගැනුම් ඒකක 700 එකක් රු.70 බැගින්

1/15 ඒකක 1500ක් එකක් රු.100 බැගින් විකුණන ලදී.

Fifo ක්‍රමයට තොග නිකුත් කිරීම සිදුවේ. පහත දෑ ගනනය කරන්න.

01) විකුණුම් පිරිවැය .....

02) දල ලාභය .....

(48) පහත සඳහන් කව්රුන් විසින් කා හට යොමු කරනු ලබයිද?

ද්‍රව්‍ය අධියාචනා පත්‍රය - .....

මිලදී ගැනුම් ඇනවුම - .....

(49) පහත සඳහන් තොරතුරු සීමිත මලීෂ සමාගමට අදාල වේ.
සාමාන්‍ය පරිභෝජනය දිනකට ඒකක 300
අවම පරිභෝජනය දිනකට ඒකක 150
සාමාන්‍ය පොරොත්තු කාලය දින 5
උපරිම පොරත්තු කාලය දින 8

පහත දෑ ගණනය කරන්න.
01) අවම පොරොත්තු කාලය .....
02) උපරිම පරිභෝජනය .....

(50) ව්‍යාපෘතියක මුදල් ප්‍රවාහය ගණනයේදී සැලකිල්ලට ගනු නොලබන ගනුදෙනු 02 සඳහන් කරන්න.

01) .....

02) .....

The National e-learning Portal for The General Education

- **පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය අනිවාර්යයි.**
- **ඉතිරි ප්‍රශ්න පහෙන් 4ක් තොරා ගෙන ප්‍රශ්න 6කට පිළිතුරු සපයන්න.**

(1) 2015.03.31 දිනට සීමිත කලන සමාගමේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර	බැර
	රු. 000	රු. 000
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන		3000
ප්‍රකාශිත වරනීය කොටස් ප්‍රාග්ධන		1000
විකුණුම්		4000
විකුණුම් පිරිවැය	2000	
අධ්‍යක්ෂ ගාස්තු	150	
විගනන ගාස්තු	82	
සේවක වැටුප් ශුද්ධ	216	
බෙදා හැරීමේ විකුණුම	180	
ණය පොළී	20	
10% ණයකර		300
බැංකු හා මුදල	390	
ගොඩනැගිලි (පිරිවැය)	4000	
මෝටර් රථ (පිරිවැය)	2000	
යන්ත්‍ර (පිරිවැය)	1000	
ණයගැතියෝ	1500	
ණයහිමියෝ		400
ආදායම් බදු ගෙවීම්	76	
රක්ෂණ ගාස්තු (මෝටර් රථ)	100	
20% ආයෝජන	2000	
ගොඩනැගිලි කුළි		144
ප්‍රත්‍යාගණන සංචිත		200
පොදු සංචිත		1500
රදවාගත් ලාභ		507
ගෙවූ අර්ථ සාධක අරමුදල්	30	
ගෙවූ කල්බදු ණය	500	
ක්ෂය සඳහා වෙන් කිරීම්		
ගොඩනැගිලි		1200
මෝටර් රථ		400
යන්ත්‍ර		500
තොග 2015.03.31 දිනට	500	
කල්බදු ණය හිමියෝ		1600
	14744	**14744**

අමතර තොරතුරු :-

1) 2015.03.31 දිනට තිබූ තොගවලින් අඩක් 2015.04.10 දින රු.200,000ට විකුණා ගෙන ඇත.

2) අස්වක අර්ථ සාධක අරමුදල් දායකය - සේවක දළ වැටුපෙන් සේවක දායකය 10%
සේවක දළ වැටුපෙන් සේවය දායකය 15%
අර්ධ වර්ෂයක අර්ථ සාධක අරමුදල් ගෙවා අර්ථ සාධක අරමුදල ගිණුමට හර කර ඉහත ශේෂ පිරික්සුමේ අර්ථ සාධක අරමුදල් ගෙවීම් යටතේ දක්වා ඇත. සේවක දායකය සම්පූර්නයෙන් අඩුකර සේවකයින්ට ගෙවන ලද ශුද්ධ වැටුප ඉහත සේවක වැටුප් යටතේ දක්වා ඇත. ඉතිරි අර්ධ වර්ෂයට අදාළ සේවක අර්ථ සාධක අරමුදල් ගෙවිය යුතුය. ඒ ප්‍රමාණය පිළබඳ කිසිදු සටහනක් තබා නැත.

3) රු. 12000 බැගින් මාසිකව ගොඩනැගිල්ල කුළියට දී 2014.10.01 දින වාර්ෂයක ගොඩනැගිලි කුළි ලබාගෙන ගොඩනැගිලි කුළි ගිණුමට බැර කර ඇත.

4) ආයෝජන ආදායම් සම්පූර්ණයෙන්ම උපචිත වේ.

5) 2015.03.31 දින ගොඩනැගිල්ල රු. 3000,000 ට ප්‍රත්‍යාගනනය කරන ලද අතර යන්ත්‍ර රු. 300,000 ට ප්‍රත්‍යාගනනය විය.
ගොඩනැගිලි වාර්ෂිකව 5% බැගින් ද, යන්ත්‍ර 10% බැගින් ද සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

6) මෝටර් රථය 2013.04.01 දින කල්බදු ණය යටතේ ලබාගෙන ඇත. මෝටර් රථයේ පිරිවැය සමාන වාර්ෂික වාරික පහකින් වාර්ෂික පොළිය රු.100,000 සමග ගෙවිය යුතුවේ. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ගෙවූ වාරිකය, ගෙවූ කල්බදු ණය ගිණුමට හර කර ඇත. වෙනත් කිසිදු සටහනක් තබා නැත. මෝටර් රථයේ ඵලදායී ජීව කළය වසර 5කි.

7) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ,

i. රු. 1000,000ක පොදු සංචිත ප්‍රාග්ධනින කරමින් ප්‍රසාද කොටස් නිකුත් කිරීම. 2015.01.01 දින ප්‍රසාද නිකුතුව සිදු කරන ලදි. නමුත් කිසිදු සටහනක් තබා නැත.

ii. රදවාගත් ඉපයීම් වලින් රු. 400,000 පොදු සංචිතයට මාරු කිරීම.

iii. වරනීය කොටස් හිමියන්ට කොටසකට රු. 5 බැගින් ලාභාංශ ගෙවීමට යෝජනා කිරීම.
(වෘ කොා. 10000 නිකුත් කර ඇත)

iv. සමාන්‍ය කොටස් 20,000න් කොටස් ප්‍රාග්ධනය සමන්විත වන අතර ඔවුනට කොටසකට රු. 3 බැගින් ලාභාංශ යෝජනා කර ඇත.

8) ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් බද්ධ බදුපෙර ලාභයෙන් ¼ කි.

අවශ්‍ය වන්නේ.

(i) ප්‍රසිද්ධ කිරීමට සුදුසු අකෘතියෙන් 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

(ii) ප්‍රසිද්ධ කිරීමට සුදුසු අකෘතියෙන් 2015/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

(iii) හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය 2015/03/31 දිනෙන අවසන් වර්ෂයට

(2)

ඇ) රුමල්, හේමල් සහ නාරද හවුලේ 2014.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය පහත් දැක්වේ. රු 000

ජංගම නොවන වත්කම්		
දේපල පිරියත උපකරණ (පොත් අගය)		1500
ජංගම වත්කම්		
බඩු තොගය	500	
වෙළෙඳ ලැබිය යුතු දෑ	400	
මුදල් හා බැංකු	300	1200
		2700
ප්‍රාග්ධන ගිණුම රුමල්	700	
හේමල්	600	1800
නාරද	500	
ජංගම ගිණුම රුමල්	140	
හේමල්	130	400
නාරද	130	
ජංගම නොවන වගකීම්		
ණය ගිණුම - නාරද		100
ජංගම වගකීම් - වෙළෙඳ ගෙවිය යුතු දෑ.	300	
ගෙවිය යුතු වියදම්.	100	400
		2700

අමතර තොරතුරු -

i. **හවුල් ගිවිසුම**

හවුල් වේතන - රුමල්, හෙමාල් නාරද පිළිවෙලින් මාසිකව රු. 10,000, රු. 5000, රු. 4000 බැගින්
ප්‍රග්ධනයට පොළි 10%
ලාභා ලාභ බෙදා ගැනීම 2 : 2 : 1 අනුපාතයට.

ii. 2014.04.01 දින නාරද හවුලෙන් විශ්‍රාම ගන්නා ලදී. ඔහුට ගෙවිය යුතු මුදල් ණය ගිණුමකට මාරු කරන ලද අතර ඒ සඳහා 10% වාර්ෂික පොළියත් ගෙවීමට එකඟ විය. නව හවුලේ ලාභ බෙදා ගැනීම රුමල් සහ හෙමාල් අතර 3 : 2 අනුපාතයට එකඟ වූ අතර අනෙක් හවුල් ගිවිසුමේ ඉතිරි කොන්දේසි වලෙසම පවත්වා ගැනීමට එකඟ විය නාරද විශ්‍රාම ගත් දින හවුලේ කීර්තිනාමය රු. 350,000 ට ඇස්තමේන්තු විය. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් මගින් ගැලපීමට හවුල්කරුවන් එකඟ විය.

iii. 2015.03.31 දිනෙන් අවසන් වන වර්ෂයේදී සිදුවූ අනෙකුත් ගනුදෙනු,

- අත්පිට විකුණුම් රු. 100000 ඇතුළුව මුළු විකුණුම් රු. 1700,000 වූ අතර ණයගැතියන්ගෙන් රු. 1000,000 එකතු කරගන්නා ලද.
- අත්පිට ගැනුම් 150,000 ඇතුව මුළු ගැනුම් රු. 850,000 වූ අතර ණය හිමි ගෙවීම් රු. 500,000 කි.
- සියළු වියදම් සඳහා රු. 200000 ගෙවූ අතර වර්ෂයේ අවසාන දිනට රු. 200000 ගෙවිය යුතුව පැවතුණි.
- දේපළ පොත් අගය මත 10% ක්ෂය කළ යුතුවේ.

iv. හේමල් සහ රුමල් නියෝජිත සේවාවන්ද ලබාදෙන අතර ඔවුනට වර්ෂය සඳහා රු. 180,000 කොමිස් මුදලක් ලැබිය යුතුව පවතී.

අවශ්‍ය වන්නේ,

1. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේ රුමල් සහ හේමල් හවුලේ ආදායම් ප්‍රකාශය (ලාභ ලාභ විසර්ජනය ද සමඟ)
2. ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් අනුතිරු ක්‍රමයට.
3. නාරදගේ ණය ගිණුම.
4. 2015.03.31 දිනට රුමල් සහ හේමාල් හවුලේ මුළු වගකීම්.

(ආ) x හා y නමින් භාණ්ඩ වර්ග දෙකක් නිපදවන රුවන් කර්මාන්ත ආයතනයේ නිෂ්පාදන පිරිවැය තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරයි.

A) පොදුකාර්ය පිරිවැය පිළිබඳ විස්තර

පොදු කාර්යය	නිශ්පාදන අංශ		සේවා අංශ
	එකලස්	නිමැවුම්	නඩත්තු
වක්‍ර ද්‍රව්‍ය	30000	60000	-
වක්‍ර ශ්‍රමය	20000	30000	20000
වක්‍ර වෙනත්	10000	10000	-
සේවක සංඛ්‍යාව	20	10	5
යන්ත්‍ර පිරිවැය	රු. 400,000	300000	-
නඩත්තු වැය	200	100	-
යන්ත්‍ර වැය	5000	3000	-
බිබී ප්‍රමාණය ව.අ	1000	500	500

B) පොදු කාර්ය පිරිවැය - විදුලි ආලෝකය රු. 20,000

වරිපනම්	රු. 40,000
යන්ත්‍ර ක්ෂය	රු. 70,000
සේවක සුභසාධනය	රු. 70,000

C) පොදු කාර්ය පිරිවැය අන්තර් ග්‍රහනයට අදාළ අනේකුත් තොරතුරු.

- නඩත්තු අංශයේ පොදුකර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු අතරේ, නඩත්තු පැය පදනම් මත නැවත විභාජනය වේ
- පොදුකාර්ය පිරිවැය ඒකකයකට අන්තර් ග්‍රහනය සඳහා අන්තර් ග්‍රහන අනුපාතය යන්ත්‍ර පැය පදනම් මත සිදු වේ.
- ඒකයක් නිපදවීමට ගතවන කාළය.

	එකලස්	නිමැවුම්
x භාණ්ඩය	පැය 5	පැය 4
y භාණ්ඩය	පැය 10	පැය 8

D) ඒකකයකට අදාළ සෘජු පිරිවැය

	x	y
ඍජුද්‍රව්‍ය	රු. 400	රු. 500
සෘජු ශ්‍රම පිරි :	රු. 160	රු. 120

E) ඒකකයක විකුණුම් මිල පිරිවැය 20% ලාභ ආන්තිකයක් එකතු කර මිල ලකුණු කරයි.

අවශ්‍ය වන්නේ,

i. පොදුකාර්ය පිරිවැය විභාජනය කරමින් පොදුකාර්ය පිරිවැය විභාජන පත්‍රිකාව.

ii. පොදුකාර්ය පිරිවැය නැවත විභාජනය.

iii. අන්තර් ග්‍රහන අනුපාත එකලස් අංශය හා නිමැවුම් අංශ සඳහා වෙන වෙනම.

iv. ඒකක පිරිවැය හා විකුණුම් මිල.

(3)

(අ) 2016 ජනවාරි මාසයේ සුජී වෙළෙඳ සැලෙහි ගනුදෙනු හා 2016.01.01 ගිණුම් ශේෂයන් පහත් දී ඇත.

		රු. 000
2016.01.01 ගිණුම් ශේෂ -	ලීබඩු	100
	තොග	40
	ණය ගැති	20
	මුදල්	60
	බැංකු ණය	50

මාසය තුල සිදුවූ ගනුදෙනු ගිණුම් සම්කරනය ඇසුරින්. රු. 000

ගණුදෙණු	වත්කම්				ප්‍රාග්ධන	වගකීම්	
අංක	මුදල්	ණයගැති	තොග	ලීබඩු		ණයහිමි	බැංකු ණය
1	-		+20			+20	
2	-40		+40				
3		+80	-50		+30		
4	+90				+90		
5	-36				-36		
6	-30				-5		-25
7	+18	-20			-2		
8	-25				+5	-30	
9				-1	-1		

අමතර තොරතුරු :-

1. ලී බඩු වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට 12% ක්ෂය කරනු ලැබේ.
2. මාසයකට රු. 6000 බැගින් මාස 6ක කුලි ගෙවා ගොඩනැගිලි කුළියට ගෙන ඇත.
3. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද රු. 30000 ඉන්වොයිස් මිල සහිත තොගයක් විකුණා ඇති බවට විකුණුම් විස්තරය ලැබුණද පොත්වල වාර්තා කර නැත.
4. මාසයට අදාල වැටුප රු. 15000 මුදල් ගෙවා හෝ වාර්තා කර පොත් නොමැත.

අවශ්‍ය වන්නේ,

i. ඉහත ගනුදෙනු අංක 1 සිට 9 දක්වා විස්තර කරන්න.

ii. ලාභ සමීකරණ මත ශුද්ධ ලාභ ගනනය කරන්න.

iii. 2016/01/ 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

ආ) 2015/12/31 දිනෙන් අවසන් වර්ෂයේ ණයගැති සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

- පොදු ලෙජරය

ණයගැති පාලන ගිණුම

01/01 ශේෂය	10,000	මුදල්	30,000
විකුණුම්	50,000	දුන් වට්ටම්	3,000
		බොල්ණය	2,000
		ආපසු එවුම්	8,000
		ප/ගෙ/ගි	17,000
	60,000		**60,000**

- ණයගැති ලෙජරය

අතුල

01/01 ශේෂය	2,000	මුදල්	7,000
විකුණුම්	10,000	වට්ටම්	1,000
		ආපසු එවුම්	2,000
		ප/ගෙ	2,000
	12,000		**12,000**

සමිතා

01/01 ශේෂය	4,000	මුදල්	10,000
විකුණුම්	15,000	ආ පසු එවුම්	4,000
		ප/ ගෙ	5,000
	19,000		**19,000**

නදුනි

01/01 ශේෂය	1,000	මුදල්	12,000
විකුණුම්	15,000	වට්ටම්	2,000
		ප/ ගෙ	2,000
	16,000		**16,000**

ගයනි

01/01 ශේෂය	3,000	මුදල්	4,000
විකුණුම්	5,000	දුන් වට්ටම්	2,000
		පා/ ගෙ	2,000
	8,000		**8,000**

- අමතර තොරතුරු :

(i) රු. 12,000 ණයට විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත්වලින් මඟහැරී ඇත. අනෙකුත් ගණුදෙණු සියල්ල ණයගැති පාලන ගිණුමෙහි නිවැරදිව වාර්තා වී ඇත.

(ii) ණයගැති ලෙජර් ශේෂ ලැයිස්තුවේ ශේෂය ණයගැති පාලන ගිණුම සමඟ එකඟ නොවේ.
අවශ්‍ය වන්නේ,
(i) වැරදි ශේෂ සහිත ණයගැති ශේෂ ලැයිස්තුව
(ii) සංශෝදන ණයගැති පාලන ගිණුම
(iii) ණයගැති ශේෂ සැසඳුම් ලේඛනය

04. අ. සීමිත සරණ සමාගම 2016 ජනවාරි මාසයට අදාල සේවක වැටුප් පිළිබඳ විස්තර වැටුප් ලේඛනයක් මගින් පහත දී ඇත.

නම	ඉපයීම්			අඩුකිරීම්				ශුද්ධ	E.P.F.	රක්ෂණ	E.T.F
	මූලික	දීමනා	දල	EPF	රක්ෂණ	ණය	මුළු		15%		3%
අනිල්	15000	5000	20000	1500	1000	1000	3500	16500	2250	500	450
සුනිල්	18000	2000	20000	1800	1000	1000	3800	16200	2700	500	540
සරත්	20000	5000	25000	2000	1000	-	3000	22000	3000	500	600
කමල්	17000	3000	20000	1700	2000	-	3700	16300	2550	1000	510

- සේවක වැටුප් ගෙවා ඇත්තේ මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදලට, රක්ෂණ වාරික හා ණය වාරික අඩුකර ගැනීමෙන් පසුවයි.
- අර්ථසාදක අරමුදලට සේවය දායකය 15% ද සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% දායක වේ.
- රක්ෂණ වාරිකය සේවක සේවය දායකය 2 : 1 අනුපාතයට මාසිකව රක්ෂණ සමාගමට ගෙවිය යුතු වේ.
- අර්ථ සාධක අරමුදල, ණය වාරික, රක්ෂණ වාරික මාසය අවසාන වනතුරු අදාල ආයතනවලට ගෙවා නැත.
අවශ්‍ය වන්නේ,
(i) අදාල පැනල් සටහන් (ii) ලෙජර් ගිණුම්

ආ) සීමිත සරණ සමාගමේ 2016 ජනවාරි මාසයේ තොග නිකුත් කිරීම් පිළිබඳ තොග ලෙජරය පහත පරිදි වේ.

තොග ලෙජරය - පෙර ඇතුළු පෙර පිට ක්‍රමය (fifo)

දිනය	ලැබීම්			නිකුත්			ශේෂය	
	ප්‍රමාණය	ඒකක මිල	වටිනම්	ප්‍රමාණය	මිල	වටිනම්	ප්‍රමාණය	වටිනම්
2016/1/1							500	5000
2016/1/10	1000	15	15000	-	-	-	1500	20000
2016/1/12	1000	18	18000	-	-	-	2500	38000
2016/1/15	-	-	-	500	?	?	?	?
2016/1/20	-	-	-	1000	?	?	?	?
2016/1/25	-	-	-	500	?	?	?	?
2016/1/30	1000	20	?	-	-	-	?	?

අවශ්‍ය වන්නේ,

(i) ඉහත වගුවෙහි හිස්තැන් පුරවන්න. ඉහත වගුවට සමාන වගුවක් ඇඳ ඉදිරිපත් කළ යුතුයි.

(ii) 2016/01/31 දින බඩු තොගයේ වටිනාකම හා නිකුත් කරන ලද මුළු තොගයේ වටිනාකම කොපමණද?

(iii) නිකුත් කරන ලද ඒකකයක් රු. 40 බැගින් විකුණා ඇත්නම් ආදායම් ප්‍රකාශයක් මගින් දළ ලාභය ගණනය කරන්න.

05. අ) 2014/01/01 දිනට දිමුතු ක්‍රීඩා සමාජයේ වත්කම් හා වගකීම් පහත පරිදි වේ.

- ක්‍රීඩා ගොඩනැගිලි 500,000
- ක්‍රීඩා භාණ්ඩ 400,000
- ලැබිය යුතු සමාජික මුදල් 60,000
- කලින් ලද සාමාජික මුදල් 30,000
- ගොඩනැගිලි පරිත්‍යාග 130,000
- මුදල් 50,000

ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් 2000 සිටින අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 250 කි.

වර්ෂයට අදාල මුදල් ලැබීම් හා ගෙවීම් -

ලද සාමාජික මුදල්	?
ගොඩනැගිලි ඉදිකිරීමේ ගාස්තු	රු. 120,000
ක්‍රීඩා භාණ්ඩ මිලට ගැණුම්	රු. 50,000
අනාථ කඳවුරු පරිත්‍යාග සඳහා ද්‍රව්‍ය මිලට ගැණුම්	රු. 240,000
ද්‍රව්‍ය බෙදාහැරීමේ වියදම්	රු. 18,000
ද්‍රව්‍ය ඇසුරුම් කිරීමට	රු. 2,000
කඳවුරට කරන ලද මුදල් පරිත්‍යාග	රු. 10,000
කඳවුරු පරිත්‍යාග සඳහා ලද මුදල්	රු. 280,000
තැන්පතු ගිණුමට බැරකරන ලද මුදල්	රු. 200,000
ක්‍රීඩා සමාජයේ වියදම්	රු. 100,000

2014.12.31 දිනට රු. 40,000 පරිත්‍යාග ද්‍රව්‍ය ඉතිරිව තිබුණි.

අත ඉතිරි මුදල් රු. 28,000 විය. ලැ/යු සාමාජික මුදල් රු. 80,000

කඳවුරු පරිත්‍යාග ගිණුමෙන් ලද අතිරික්තය ක්‍රීඩා සමාජයේ ආදායමක් සේ සලකනු ලබයි.

අවසන් දිනට දේපල පිරියත වටිනාකම රු 1,000,000 විය.

අවශ්‍ය වන්නේ,

(i) සාමාජික මුදල් ගිණුම

(ii) අනාථ කඳවුරු පරිත්‍යාග ගිණුම

(iii) 2014/12/31 දිනෙන් අවසන් වර්ෂයට ආදායම් හා වියදම් ගිණුම

(iv) 2014/12/31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(v) ලැබීම් හා ගෙවීම් ගිණුම

ආ) සීමිත පුබුදු සමාගම 2016 ජනවාරි මාසයේ සමාගමේ බැංකු ජංගම ගිණුමේ බැංකු ප්‍රකාශනය පහත දී ඇත.

	හර	බැර	ශේෂය
ශේෂය 16.01.01			5000
තැන්පතු		9000	14000
චෙක් 211140	4000		10000
තැන්පතු - චෙක්		25000	35000
චෙක් - 211141	18000		17000
නිත්‍ය නියෝග - රක්ෂණ	4000		13000
ප්‍රේෂණ - ණයගැති		12000	25000
ඉතුරුම් ගිණුමෙන් මාරු		5000	30000
චෙක් 211142	14000		16000
ණය ගිණුමට මාරු	8000		8000

- 2016.01.01 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 10,000
  2016.01.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 21,000
  මාසය තුළ සමාගම විසින් තැන්පත් කරන ලද මුලු චෙක් තැන්පතු රු. 49,000 කි.
  211140 චෙක්පත දෙසැම්බර් මාසයේ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පතකි.
  211143 දරන චෙක්පතින් 2016.01.28 ගෙවන ලද රු. 6000 ගෙවීමට ඉදිරිපත්ව නැත.

අවශ්‍ය වන්නේ,

(i) 2016 ජනවාරි මාසයේ බැංකු ගිණුම සංශෝදනය කිරීම.

(ii) 2016 ජනවාරි මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනය (ලැ.4)

06. 2015/03/31 දිනෙන් අවසන් වන වර්ෂයේ සීමිත තරිඳු සමාගම තම සමාගමේ මූල්‍ය ප්‍රකාශ පහත පරිදි ඔබ වෙත ඉදිරිපත් කරයි.

i. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

විකුණුම්		6000
විකුනුම් පිරිවැය		3500
		2500
වෙනත් ආදායම්		500
		3000
පරිපාලන වියදම්	(780)	
බෙදාහැරීමේ වියදම්	(820)	
වෙනත්	(200)	
මූල්‍ය	(100)	1900
ආදායම් බදු පෙර ශුද්ධ ලාභය		1100
ආදායම් බදු		275
කාලච්ඡේදයේ ශුද්ධ ලාභය		825
ප්‍රත්‍යාගණන සංචිතය		300
විස්තීර්ණ ශු/ලාභය		1125

ii. 2015/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය රු.000

		14/4/1	15/3/31
දේපල පිරියත උපකරණ		3000	5400
ජංගම වත්කම්	තොග	900	1100
	ණයගැති	1300	1500
	මුදල්	600	200
		5800	8200
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		3000	4000
සංචිත පොදු සංචිත		1000	1500
රඳවාගත් ඉපයීම්		400	600
ප්‍රත්‍යගනන සංචිත		200	500
ජංගම නොවන වගකීම් - ණයකර		500	700
ජංගම වගකීම් - ණයහිම්		200	600
ගෙවිය යුතු දෑ		500	300
		5800	8200

iii. අමතර තොරතුරු

- රු. 125,000 අතුරු ලාභාංශ ගෙවා ඇත.
- රු. 50,000 පොදු සංචිතයට මාරු කරන ලදී.
- මෝටර් රථ ක්ෂය රු. 400,000 බෙදාහැරීමේ වියදම් යටතේ ද ගොඩනැගිලි ක්ෂය රු. 300,000 පරිපාලන වියදම් යටතේ ද දක්වා ඇත.
- ගෙවිය යුතු වියදම් සංයුතිය

විස්තරය	14/4/1	15/3/31
පොලී	50	125
බදු	125	100
පරිපාලන	200	75-
බෙදාහැරීම්	125	
	500	**300**

අවශ්‍ය වන්නේ,

(i) 15/3/31 දිනෙන් අවසන් වර්ෂයට ප්‍රමිත අංක 7 අනුව මුදල් ප්‍රවාහය

07. අ.) සීමිත නදීර සමාගම පහත සඳහන් පිරිවැය තොරතුරු ඔබ වෙත සපයයි.

- දායක විකුණුම් අනුපාතය 40%
- ස්ථාවර පිරිවැය රු. 80,000

මෙම තොරතුරු ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(i) සමච්ඡේදන අවස්ථාවට අදාල මුළු විකුණුම් වටිනාකම

(ii) මුළු විචල්‍ය පිරිවැය

(iii) සමච්ඡේදන විකුණුම් ඒකක ප්‍රමාණය ඒකක 10000 නම් පහත දෑ ගණනය කරන්න.

(a) ඒකක විකුණුම් මිල (b) ඒකක විචල්‍ය පිරිවැය (c) ඒකක දායකය

(iv) වර්තමාන විකුණුම් ඒකක ගණන 20,000නම් ආන්තික පිරිවැය ආදායම් ප්‍රකාශයක් මගින් ලාභය හෝ අලාභය ගණනය කර පෙන්වන්න.

(v) ඒකක 20,000 දී ආරක්ෂිත ආන්තිකය ගණනය කරන්න.

(vi) ඒකක 5000 සිට ඒකක 20000 දක්වා විකුණුම් මට්ටම් වලට අදාලව ලාභ සටහන අඳින්න.

ආ) රු. 2,500,000 වටිනා යන්ත්‍රයක් මිලට ගැනීමට අපේක්ෂා කරන සීමිත පුබුදු සමාගම එම ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහයන් පහත පරිදි ඉදිරිපත් කරයි.

- කාරක ප්‍රාග්ධනය සඳහා රු. 50,000 ව්‍යාපෘති ආරම්භයේදී යොදන අතර ව්‍යාපෘතිය අවසානයේදී එය ලද මුදල් ප්‍රවාහයක් සේ සැලකේ.
- පවතින උපකරණයක් ව්‍යාපෘතිය සඳහා යොදාගැනෙන අතර එහි පිරිවැය රු. 60,000 කි. විකුණුම් මිල රු. 40,000
- පැවති පරණ යන්ත්‍රය විකුණා රු. 100,000 ලබාගනී.
- රු. 100,000 බැගින් වාර්ෂිකව ආදායමක් උපයා ගැනෙන අතර ඒ සඳහා රු. 40,000 මුදලක් වැයවේ.
- නව යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය වසර 5 කි. වසර 5 අවසානයේ සුන්බුන් අගය රු. 10,000 ක යොදාගත් පරන උපකරණ ව්‍යාපෘතිය අවසානයේදී රු. 5,000 ට විකුණා ගනී.

අවශ්‍ය වන්නේ,

(i) ව්‍යාපෘතිය ආරම්භයේ මුදල් ප්‍රවාහය

(ii) ව්‍යාපෘති කාලයට අදාල අනෙකුත් මුදල් ප්‍රවාහ

(iii) පිළිගෙවුම් කාලය

(iv) ශුද්ධ වර්තමාන අගය (ප්‍රාග්ධනයේ පිරිවැය 10%)

(iv) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතිය පිලිගන්නේද·නැද්ද යන්න සඳහන් කරන්න.

වර්ෂය	1	2	3	4	5
රුපියලක වර්තමාන අගය	.90	.87	.75	.69	.60